Please check the examination details below before entering your candidate information

| Candidate surname | Other names |
|---|---|
| | |

Centre Number | Candidate Number

**Pearson Edexcel International GCSE (9–1)**

# Tuesday 6 June 2023

Afternoon (Time: 2 hours 30 minutes)

**Paper reference** **4SI1/01**

# Sinhala

## PAPER 1: Reading, Writing and Translation

**You do not need any other materials.**

Total Marks

## Instructions

- Use **black** ink or ball-point pen.
- **Fill in the boxes** at the top of this page with your name, centre number and candidate number.
- There are **three** sections you must answer:
  – Section A Questions 1–4
  – Section B Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c)
  – Section C Question 7.
- Answer the questions in the spaces provided
  *– there may be more space than you need.*
- You must **not** use a dictionary.

## Information

- The total mark for this paper is 100.
- The marks for **each** question are shown in brackets
  *– use this as a guide as to how much time to spend on each question*.

## Advice

- Read each question carefully before you start to answer it.
- Check your answers if you have time at the end.

*Turn over*

P72690RA

©2023 Pearson Education Ltd.
N:1/1/1/1/

P 7 2 6 9 0 R A 0 1 2 0

Pearson

## SECTION A
## Reading

**Answer ALL questions.**

**Write your answers in the spaces provided.**

**Multiple-choice questions must be answered with a cross in a box ☒. If you change your mind about an answer, put a line through the box ☒ and then mark your new answer with a cross ☒. Open-response questions do not have to be written in full sentences and you may respond using single words or phrases.**

1 පහත සඳහන් පාඨය කියවා එම තොරතුරුවලට අනුව දී ඇති **සිංහල** වාක්‍යවල හිස් තැන් පුරවන්න. වගුවේ ඇති පිළිතුරුවලින් නිවැරදි පදය තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.

**සත්ත්ව සුභසාධනය**

ඔබ සතුන්ට ආදරය දක්වන හා ඒ වෙනුවෙන් ස්වේච්ඡාවෙන් වැඩ කිරීමට ළැදි අයෙක් නම් ගාල්ල නගරයට ආසන්න සතුන්ගේ රැකවරණය සඳහා ම ඉදි කළ විශේෂිත නිවහන ඊට සුදුසු ම ස්ථානය වේ. බල්ලන්ට හා බළලුන්ට නිදැල්ලේ හැසිරිය හැකි ලෙස නිමවා ඇති මෙම අලංකාර නිවහන අනතුරුවලට ලක් විය හැකි සතුන්ට පරිපූර්ණ ආරක්ෂාව සහිත දිව්‍ය විමානයකි. 2007 වර්ෂයේ දී ආරම්භ කළ මෙම ස්ථානය පසු ගිය වසර කිහිපය තුළ ලොව පුරා වෙසෙන බොහෝ මිනිසුන්ගේ සහයෝගයෙන් වර්ධනය වී ඇත.

එම ප්‍රදේශයේ සියයකට අධික වීදි සුනඛයින් අධීක්ෂණය කිරීම, රැක බලා ගැනීම හා ආහාර පාන සැපයීම සඳහා මෙම ව්‍යාපෘතියට වහා ම ස්වේච්ඡා සේවකයන් අවශ්‍යව ඇත. ආහාර පිසීමෙන් හා ඒවා බෙදා දීමට සුදුසු ශාක පත්‍ර සොයා දීමෙන් ඔබට දායක විය හැකි ය. වීදි සුනඛ ගහනය අවම කිරීම අරමුණු කරගත් මෙම දීර්ඝ කාලීන හා තිරසාර ව්‍යාපෘතියට ඔබ දායක වනු ඇත. අධ්‍යාපනය ලබා දීම හා සුරතලෙකුට නව අයිතිකරුවෙකු සොයා දීම මගින් මෙම සතුන්ගේ ජීවිතවල වෙනසක් කිරීමට මෙය මහඟු අවස්ථාවකි.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

| | | | |
|---|---|---|---|
| **A** ස්වේච්ඡා සේවකයන් | **B** වැඩකාරයන් | **C** සත්ත්ව ලෝලීන් | **D** සහය |
| **E** වීදි සැරීම | **F** සමීප | **G** වැඩි කිරීම | **H** සූදානම් |
| **I** නිදහසේ හැසිරීම | **J** සුරතලුන් | **K** අඩු කරීම | **L** දුර |
| **M** අනුභව | | | |

| **උදාහරණය:** | සංවිධානයට ස්වේච්ඡා සේවකයන් අවශ්‍යව ඇත. | *A* |
|---|---|---|
| **1** (a) | මෙම දැන්වීම ......... අරමුණු කර ඇත. | |
| **1** (b) | ගාල්ල නගරයට ......... ස්ථානයක මෙය පිහිටියේ ය. | |
| **1** (c) | නිවහන සතුන්ට ......... සඳහා ඉඩ දී ඇත. | |
| **1** (d) | ලොව බොහෝ දෙනෙක් වැඩසටහනට ......... දෙති. | |
| **1** (e) | සේවකයන් විසින් ආහාර ......... කළ යුතු ය. | |
| **1** (f) | වීදි සුනඛ ගහනය ......... වැඩසටහනේ අරමුණකි. | |


**(Total for Question 1 = 6 marks)**

DO NOT WRITE IN THIS AREA

**2** ශ්‍රී ලංකාවේ දේශගුණය ගැන කථා කරන මෙම ළමුන් තිදෙනාගේ ප්‍රකාශ කියවා එම තොරතුරුවලට අනුව පහත වගුව පුරවන්න. නිවැරදි කොටු 8 තුළ එක් කතිරය බැගින් යොදන්න. ඇතැම් වාක්‍යයකට හෝ පුද්ගලයෙකුට කතිර එකකට වඩා තිබිය හැකි අතර ඇතැම් විට එකක්වත් නොතිබිය හැකි ය.

## ශ්‍රී ලංකාවේ දේශගුණය

**නිරාශා**




ශ්‍රී ලංකාවේ පවතින දේශගුණය නිවර්තන කලාපීය දේශගුණයක් වන්නේ මෙම දිවයින සමකයට ආසන්නව පිහිටා ඇති බැවින් වසර පුරාවට ම සූර්ය තාපයට සම්පූර්ණයෙන් ම නිරාවරණය වන බැවිනි. වෙරළාසන්න ප්‍රදේශවල සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 27ක් පමණ වන අතර කඳුකර ප්‍රදේශයට යන විට එම අගය ක්‍රමයෙන් පහළ යයි. මෙම තත්ත්වය මෝසම් කාලවලදී වෙනස් විය හැකි නමුත් සාමාන්‍ය කියවීම් අනුව ඉහත සඳහන් පරිදි පවති.

**ඉබ්‍රාහිම්**



කාලයත් සමග දේශගුණික තත්ත්වයන් ද වෙනස් වන බවක් පෙනෙන්නට තිබේ. සාමාන්‍යයෙන් දෙසැම්බර් මාසයේ ආරම්භ වන සීත කාලය වර්තමානය වන විට තරමක් ප්‍රමාද වී පැමිණෙන බව පෙනෙන්නට ඇත. සාමාන්‍යයෙන් මැයි මාසයේ දී හමන වෙසක් සුළන් හා ජූලි මාසයේ පිපෙන ඇසළ මල්වල ද ස්වාභාවික කාල රමුව ප්‍රමාද වේ. ඇසළ පොහොය කාලයට ඇසළ මලින් පිරුණු අපේ ගම් තව දුරටත් අපට දැක ගැනීමට නොහැක.

**සෙල්වම්**



ප්‍රමාණවත් තරම් ජලය මෝසම් වර්ෂාවෙන් නොලැබෙන බැවින් රටේ ජල අවශ්‍යතාව එම වර්ෂාපතනයෙන් සපුරා ගත නොහැකි වී තිබේ. පසුගිය වසර 30ක පමණ කාලය තුළ එක් රැස් කළ කාලගුණ වාර්තා පරීක්ෂා කර බලන අයෙකුට රටේ උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යන බවත් වර්ෂාපතනය පහළ යන බවත් දැකිය හැකි ය. පරිසර දූෂණය වැනි මානව ක්‍රියාකාරකම් මෙම දේශගුණික විපර්යාසවලට වගකිව යුතු ය.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P72690RA0420

| | | නිරාශා | ඉබ්‍රාහිම් | සෙල්වම් |
|---|---|---|---|---|
| **උදාහරණය:** | නිවර්තන දේශගුණයක් ඇතැයි පවසයි. | ☒ | ☐ | ☐ |
| **A** | දේශගුණය වෙනස් වී ඇතැයි කියයි. | ☐ | ☐ | ☐ |
| **B** | මෝසම් වැසි ගැන පවසයි. | ☐ | ☐ | ☐ |
| **C** | ශ්‍රී ලංකාව සමකාසන්න රටක් බව කියයි. | ☐ | ☐ | ☐ |
| **D** | කලක සිට දේශගුණ විපර්යාස නිරීක්ෂණය කරයි. | ☐ | ☐ | ☐ |
| **E** | සුළන් හමන දිශාව ගැන කියයි. | ☐ | ☐ | ☐ |
| **F** | උෂ්ණත්වය ගැන කථා කරයි. | ☐ | ☐ | ☐ |

**(Total for Question 2 = 8 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**3** නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පිළිබඳ කියැවෙන මෙම ලිපිය කියවා පහතින් දී ඇති වාක්‍යවල හිස් තැන් **සිංහල** වචන හෝ අංක යොදා පුරවන්න.

**නිර්මාණාත්මක ක්‍රියාකාරකම්**

රජයේ පාසල් මගින් ලබා දෙන විධිමත් අධ්‍යාපනය තරඟකාරී එකක් වීම හේතුවෙන් එය දරු දැරියන් කෙරෙහි මහත් පීඩනයක් ඇති කරන බව ප්‍රකට ය. මෙම පීඩනය අව ම කිරීම සඳහා වැඩෙන දරුවන්ට නිර්මාණාත්මක ක්‍රියාකාරකම් පාදක කර ගත් අවිධිමත් අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දීමේ දැඩි අවශ්‍යතාවක් පැන නැගී ඇත. මෙම අවශ්‍යතාව යම් පමණකට හෝ සපුරාලිය හැකි එක් වැඩසටහනක් ලෙස "නිර්මාණාත්මක ක්‍රියාකාරකම්" නම් වැඩසටහන හඳුන්වා දිය හැකි ය. එම වැඩසටහනේ මූලික පරමාර්ථය වන්නේ දරුවන්ගේ කායික හා මානසික අංශ සංවර්ධනය තුළින් මනා පෞරුෂයක් ද, සෞන්දර්යාත්මක අත්දැකීම් ලබා දීම තුළින් කලා රසිකත්වයක් හා ප්‍රීතිමත් ජීවිතයක් ද, ගත කළ හැකි උදාර මානවයෙක් තැනීමයි.

වයස අවුරුදු හතරහමාරේ සිට පහළොව දක්වා දරු දැරියන්ට මෙම වැඩසටහනට සහභාගි විය හැකි ය. විවිධ කලා මාධ්‍යවලට අමතර ව ප්‍රධාන වශයෙන් ආත්ම විශ්වාසය හා ගෞරවාන්විත ව ජීවත් වීමේ මග මෙහි දී ඉගෙන ගැනීමට අවස්ථාව ලැබෙයි. සංගීතය, චිත්‍ර හා නර්තනය වැනි සෞන්දර්ය විෂයයන් පවා විභාග කේන්ද්‍රීය වී ඇති කාලයක මෙම වැඩසටහන මගින් සහභාගිවන්නන්ට සම්පූර්ණයෙන් ම වෙනස් අත්දැකීමක් ලබා ගත හැකි ය.

ජාත්‍යන්තර ළමා හා තරුණ නාට්‍ය සංගමයේ සහ ලංකා ළමා හා යොවුන් රඟහල පදනමේ නිර්මාතෘ සෝමලතා සුභසිංහ මහත්මිය විසින් ආරම්භ කරන ලද මෙම වැඩසටහන එදා සිට මේ දක්වා ම නිර්මාණාත්මක කටයුතුවල නියැළීම සඳහා වාර්ෂිකව පවත්වනු ලැබේ.

DO NOT WRITE IN THIS AREA

**උදාහරණය:** මෙම ඡේදයෙන් කියවෙන්නේ ...**නිර්මාණාත්මක ක්‍රියාකාරකම්**... ගැන ය.

(a) .............................................. හා .............................................. යනු පාසල් අධ්‍යාපනයේ ඇති අහිතකර ලක්ෂණ දෙකකි. **(2)**

(b) මෙහි .............................................. හා .............................................. යනුවෙන් අධ්‍යාපන ක්‍රම දෙකක් ගැන සඳහන් වේ. **(2)**

(c) වැඩසටහනේ ප්‍රධාන අරමුණු දෙක වන්නේ .............................................. හා .............................................. අංශ වර්ධනය කිරීමයි. **(2)**

(d) වැඩසටහනට බඳවා ගනු ලබන්නේ .............................................. පහළ වයසේ දරුවන් පමණි. **(1)**

(e) මෙහි උගන්වන වැදගත් ම කරුණු දෙක .............................................. හා

.............................................. කියා දීමයි. **(2)**

(f) .............................................. විභාග ඉලක්ක කර ඉගැන් විය යුතු නොවේ. **(1)**

(g) මෙම ආයතනය ආරම්භ කළේ .............................................. විසිනි. **(1)**

(h) වැඩසටහන පවත්වනු ලබන්නේ .............................................. වරක් පමණි. **(1)**

**(Total for Question 3 = 12 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**4** චන්දිම ගෝමස් මහතා විසින් ලියන ලද **"ධනවතෙකු වීමේ මග"** නමැති කෘතියෙන් උපුටා ගන්නා ලද පහත සඳහන් ඡේදය කියවන්න.

**ඉතිරි කිරීමේ අගය**

"තම අත ඇති රුපියලෙන් ශත 50ක කෑම වේලක් අනුභව කොට ශත 50ක් ඉතිරි කරන ලෙස ඔබේ දරුවාට උගන්වන්න. එවිට ඔහුට ශත 50ක ඉතිරියකුත් තවත් දරුවෙකු සඳහා ආහාර වේලකුත් ඉතිරි වනු ඇත. මෙය කළ යුත්තේ යහපත් චේතනාවකින් මිස හුදෙක් මුදල් ඉතිරි කිරීමේ පටු ලෝභ චේතනාවෙන් නොවේ. ඔබගේ නිවසේ නිකරුනේ දැල්වෙන විදුලි බුබුලක් නිවා දැමිය යුත්තේ ද අප වෙනුවෙන් ම පමණක් නො ව මුළු මහත් ලෝකයේ ම යහපත වෙනුවෙන් ය.

මීට වසර දහයකට පමණ පෙර දිනයක මම ධනවත් ව්‍යාපාරිකයෙකුගේ නිවසකට ඉංජිනේරු උපදේශන කටයුත්තක් සඳහා ගියෙමි. කිරුළපන ප්‍රදේශයේ පිහිටි ඔහුගේ මාලිගාවක් බඳු සුවිසල් නිවසට මා ඇතුළු වන විට වේලාව රාත්‍රී අට පමණ වී තිබුණි. එම අවස්ථාවේ ඔහුගේ නිවස විවිධ වර්ණයෙන් යුත් විදුලි බුබුළු එළියෙන් බබළමින් මනස්කාන්ත දර්ශනයක් මවමින් තිබුණි. තාප්පයට ඇතුළතින් ඇසුණ සංගීත නාදයෙන් නිවසේ සාදයක් පවතින බව මට වැටහුණි.

ගේට්ටුවේ රැකවල් ලා සිටි මුරකරුට කථා කළ විට ඔහු මගේ පැමිණීම දැන සිටි බව කියූ අතර ව්‍යාපාරිකයාගේ කන්තෝරුවට මා රැගෙන ගියේ ය. ගෙවත්තේ හාත්පස දැල්වෙමින් තිබුණු දහසකුත් එකක් විදුලි බුබුළු දෙස බලා මේ මොන විදුලි නාස්තියක් දැයි මම කල්පනා කළෙමි.

මා ඔහුගේ කාර්යාල පරිශ්‍රයට ඇතුළු වන විටත් ව්‍යාපාරිකයා මා පිළිගැනීම සඳහා එහි පැමිණ සිටියේ ය. අදාළ උපදේශන කටයුත්ත ගැන ඔහු හා කථා කර ගැනීමෙන් අනතුරු ව මෙවැනි මිනිසුන්ගේ නාස්තිකාර ජීවිත ගැන සිතමින් හා බලශක්තිය කෙතරම් ධනාත්මක ව භාවිත කළ හැකි ද යන වග කල්පනා කරමින් මම ඔහුගේ නිවහනින් පිට වී ගියෙමි."

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** (a) පාඨයේ ඇති තොරතුරුවලට අනුව අසා ඇති ප්‍රශ්නවලට සිංහලෙන් පිළිතුරු සපයන්න. පිළිතුරු සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අවශ්‍ය නොවේ.

(i) ඉතිරි කිරීමේ පුරුද්ද මගින් ළමයෙකුට ඉගෙන ගත හැකි කරුණු දෙක මොනවා ද? **(2)**

(ii) අප විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කළ යුත්තේ ඇයි? **(1)**

(iii) ව්‍යාපාරිකයා තම නිවසට රවකයා කැඳවූයේ ඇයි? **(1)**

(iv) ව්‍යාපාරිකයාගේ නිවස පිහිටා ඇත්තේ කොහේ ද? **(1)**

(v) රවකයා දුටු විට මුරකරු දැක් වූ ප්‍රතිචාරය කුමක් ද? **(1)**

(vi) එම නිවසේ ප්‍රිය සම්භාෂණයක් ඇතැයි රවකයාට සිතුනේ ඇයි? කරුණු දෙකක් ලියන්න. **(2)**

(vii) රවකයා කළකිරීමෙන් යුතුව කල්පනා කළ කරුණු දෙක මොනවා ද? **(2)**

4 (b) අනාගතය වෙනුවෙන් ඉතිරි කිරීමේ පුරුද්ද ගැන මෙම ළමුන් දෙදෙනා අතර කෙරෙන පහත සඳහන් සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට සිංහලෙන් පිළිතුරු සපයන්න.

තමාරා
යමෙකුට පුරුද්දක් ලෙස ඉතිරි කළ හැකි නම් කිසිවෙකුට බරක් නැතිව ජීවත් වෙන්න පුළුවන්. අපට එදිනෙදා වියදමට ලැබෙන මුදල්වලින් රුපියලක් දෙකක් හරි හැමදා ම ඉතිරි කරන්න සැලසුම් කරනවා නම් ටික කාලයක් ගත වන විට ලොකු මහන්සියක් නැතිව ම අපට අපේ ඉතුරුම්වල විශාල මුදලක් ඉතිරි කර ගන්න පුළුවන්. මුදල් ඉතිරි කිරීම කියන්නේ ඉතිරි කිරීමට ඇති එක ම ක්‍රමය නොවෙයි. අපට ආහාර පාන හා බඩු භාණ්ඩ වැනි ඕනෑ ම දෙයක් අනාගතය වෙනුවෙන් ඉතිරි කරන්න පුළුවන්.

අපේ තාත්තා ඉස්සර කාලෙ ඔහු විසින් ඉතිරි කරන ලද මුදලක් පස්සෙ විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙකු ව සිටිය දී ඔහුගේ වියදමට ගත්තලු, එයාගෙ වියදමට දෙන්න අපේ සීයා ළඟ මුදල් නො තිබුණු දවසක. හදිසි අවස්ථාවක ඉතිරි කළ මුදලක් අතේ ඇත්නම් සිතට දැනෙන සහනය වචනවලින් විස්තර කරන්න බැරි තරම්. අනාගතයේ යම් ආයෝජනයක් කරන්න වුනත් ඉතිරි කිරීම අනිවාර්යයි.

කිංස්ලි
අප අමතක නො කළ යුතු තවත් එක් කාරණයක් තමයි නාස්ති නොකර ඉදීමට හුරු පුරුදු වීම වැදගත් බව. සමහර විට අපට අපේ දෙමව්පියන්ගෙන් වියදමට කියල ලැබෙන හැම සතයක් ම අපි නිකරුණේ වියදම් කරන අවස්ථා තිබෙනවා. සමහර වෙලාවට අපි අපේ දෙමාපියන්ගෙන් වැඩිපුර මුදල් ඉල්ල ගෙන අපට අත්‍යවශ්‍ය නොවන දේවල් මිල දී ගන්නවා. අපි එවැනි වැඩ කිරීමෙන් වැළකී සිටිය යුතුයි. මුදල් පමණක් නො ව ඇතැමුන් ද්‍රව්‍ය සහ උපකරණ කිසි ම හේතුවක් නැති ව විනාශ කර දමනවා.

වෙනත් වචනයකින් කියනවා නම්, නාස්තිය අව ම කිරීම යනු එක්තරා ආකාරයක ඉතිරි කිරීමක්. අරපිරිමැස්මෙන් වැඩ කිරීමෙන් වියදම් අඩු කරන්න පුළුවන්. එහෙම යමක් ඉතිරි කර ගත හොත් අනාගතයේ දුෂ්කර කාලයක් ආවොත් එය ප්‍රයෝජනයට ගන්න පුළුවන්. ළමයින් වශයෙන් අපි පාවිච්චි කරන ලද දේවල් නැවත භාවිත කිරීමේ හා ඒවා ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ පුරුද්ද වැඩි දියුණු කර ගත යුතු වෙනවා. අන්න ඒ නිසයි අපි පාසලේ ගොඩනැගිලි, මේස පුටු, බංකු ආදි දේවල් විනාශ කිරීමට විරුද්ධ විය යුත්තේ.

(i) පළමු කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- ඉතිරි කිරීමේ පුරුද්ද දියුණු කිරීම: **(1)**
- ඉතිරි කිරීමේ ඇති වාසි: **(1)**

..............................................................................................................................................

..............................................................................................................................................

(ii) දෙවන කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- අනාගත පරපුර උදෙසා ඉතිරි කිරීමේ අවශ්‍යතාව: **(1)**
- නාස්තිය අවම කිරීමේ මාර්ග: **(1)**

..............................................................................................................................................

..............................................................................................................................................

**(Total for Question 4 = 14 marks)**

**TOTAL FOR SECTION A = 40 MARKS**





DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

## SECTION B
## Writing

Answer Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c).

**Write your answers in the spaces provided.**

**5**

**ආදර්ශමත් චරිතයක්**

ඔබ වඩාත් ප්‍රිය කළ පුද්ගලයෙක්

එම තැනැත්තාට කැමති වීමට ඇති හේතු

ආදර්ශමත් චරිතයක් අනුගමනය කිරීමේ වැදගත්කම

එබඳු චරිතවල අනාගත බලපෑම

වචන 85ක් පමණ භාවිත කරමින් ආදර්ශමත් චරිතයක් ගැන **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඉහත සඳහන් වචන සියල්ලම භාවිත කළ යුතු ය.

**(Total for Question 5 = 14 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**6** පහත සඳහන් විකල්ප තුනෙන් එකක් තෝරාගෙන වචන 145ක පමණ **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඔබ තෝරාගත් විකල්පයට අදාළ ව පිළිතුරු සපයන්න.

## පළමු විකල්පය

(a)



චාරිකා යෑමේ ඇති වැදගත්කම පිළිබඳ ව ළමා සඟරාවකට යැවීම පිණිස රචනාවක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- චාරිකා යෑමේ ඇති ප්‍රයෝජන
- ඔබේ යහළුවන් සමග ඔබ මෑතක දී ගිය චාරිකාවක්
- අනාගත චාරිකාවක් සඳහා ඔබේ සැලසුම්

**(26)**

## දෙවන විකල්පය

(b)

අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් යොවුන් ක්‍රීඩා සංගමයක සාමාජිකයකු යැයි සිතා, ක්‍රමික ව්‍යායාම මගින් සෞඛ්‍යයට ඇති වාසි විග්‍රහ කරමින් ක්‍රීඩා සඟරාවක පළ කිරීම සඳහා රචනාවක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- මූලික දෛනික ව්‍යායාම චර්යා
- ක්‍රීඩා ක්‍රියාකාරකම් සමග ඔබේ මෑත කාලීන අත්දැකීම්
- ඊළඟ සතියේ අභ්‍යාස සඳහා ඔබේ සැලසුම්

**(26)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

## තෙවන විකල්පය

(c) ශ්‍රී ලංකාව රටක් වශයෙන් සන්නිවේදනය සඳහා තාක්ෂණය භාවිත කරන ආකාරය ගැන බ්ලොග් සටහනක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- තාක්ෂණයේ වර්තමාන භාවිතය
- ඔබේ දෙමව්පියන් තාක්ෂණය භාවිත කළ ආකාරය
- අනාගත කාලයේ තාක්ෂණය භාවිතය

**(26)**

**Indicate which question you are answering by marking a cross ☒ . If you change your mind, put a line through the box ☒ and then indicate your new question with a cross ☒ .**

☒ **Question 6(a)** ☒ **Question 6(b)** ☒ **Question 6(c)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P 7 2 6 9 0 R A 0 1 4 2 0

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 6 = 26 marks)**

**TOTAL FOR SECTION B = 40 MARKS**



P 7 2 6 9 0 R A 0 1 6 2 0

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

## SECTION C
## Translation into Sinhala

**Write your answer in the space provided.**

7 පහත සඳහන් ඡේදය **සිංහලට** නගන්න.

> A country's traditional costume can tell people a lot about the history and the life of that country. Any research into the subject of Sri Lanka's traditional dress must begin with the native people of the island. The garment they designed was minimal, functional, and ideally suited to the climate and environment of the island.
>
> Dresses like sarees and sarongs were affected by other cultures making them more beautiful and attractive. You will see schoolteachers and office women wearing sarees, while men of all cultures and professions wear sarongs.

**(20)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 7 = 20 marks)**

**TOTAL FOR SECTION C = 20 MARKS**
**TOTAL FOR PAPER = 100 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P 7 2 6 9 0 R A 0 1 8 2 0

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**

**BLANK PAGE**

**Source information**

**Question 2**
© Findlay/Alamy Stock Photo
© Goran Bogicevic/Alamy Stock Photo
© Celia Mannings/Alamy Stock Photo

**Question 6**
© Matyas Rehak/Alamy Stock Photo



DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA